## විරාම ලක්ෂණ

ලේඛන කාර්යයේ දී අපට නිතර භාවිත කිරීමට සිදුවන විරාම ලක්ෂණ කිහිපයක් පහත දක්වා ඇත. එම විරාම ලක්ෂණ ඔබේ විභාග කටයුතුවලදී මෙන්ම ඕනෑම ලේඛන කාර්යයකදී භාවිතයට ගන්න. නිවැරදිව විරාම ලක්ෂණ යෙදීම මගින් අදාළ ලේඛනය පාඨකයාගේ මනා ග්‍රහණයට හසු වේ.

| විරාම ලක්ෂණය | යෙදෙන අවස්ථාව |
|---|---|
| . (තිත) | වාක්‍ය අවසානයේ, නම් කෙටි කොට දැක්වීම |
| , (කොමාව) | වාක්‍යයක කොටස් අතරමැද විරාමයක් දැක්වීම |
| ? (ප්‍රශ්නාර්ථ ලකුණ) | ප්‍රකාශය ප්‍රශ්නයක් බව දැක්වීම |
| ! (විස්මයාදි ලකුණ) | විස්මය, ප්‍රීතිය, ශෝකය, ප්‍රාර්ථනය ආදිය දැක්වීම |
| ; (තිත් කොමාව) | ඒක කර්තෘක වාක්‍ය සම්බන්ධ කිරීම |
| : (දෙතිත) | නිදසුන් හා විස්තර දැක්වීම/ අනුපාත දැක්වීම |
| “ ” (යුගල උඩු කොමා) | ප්‍රකෘති කථන, උද්ධෘත පාඨ, විශේෂ ව්‍යවහාර දැක්වීම |
| ‘ ’ (තනි උඩු කොමා) | ප්‍රකාශයක ඇතුළත් විශේෂ ව්‍යවහාර දැක්වීම |
| - (කෙටි ඉර) | කාල පරිච්ඡේද ඉලක්කමෙන් දැක්වීම |
| / (ඇල ඉර) | විකල්ප ව්‍යවහාර දැක්වීම |

<u>අභ්‍යාසය :</u>

පහත සඳහන් වාක්‍යවලට සුදුසු පරිදි විරාම ලක්ෂණ යොදන්න.

01 ඔබට සුබ අලුත් අවුරුද්දක් වේවා
02 පෙ ව 10 00ට රැස්වීම පැවැත්වේ
03 අනුරාධපුරය පොළොන්නරුව දඹදෙණිය වැනි නගර අපේ පැරණි රාජධානි විය
04 විශේෂ ආරාධිත අමුත්තා පැමිණයේ ය කතා කළේ ය පිටත්ව ගියේ ය
05 ස්වාමීන් වහන්ස මහත්මයාණෙනි මහත්මියනි ඊට ඔබ වහන්සේගේ ඔබතුමාගේ ඔබතුමියගේ සහාය ලබා දෙන්න
06 අ පො ස සා පෙළ විභාගය පැවැත්වෙන්නේ කවදා ද
07 ඇදුරුතුමනි මම හෙට සවස තුනට එමි

08 ඔන්න මලේ ඔය නාමල නෙළා වරෙන් යනු පාරු කවියක එන්නකි

09 ක්‍රි ව 1815 1948 දක්වා ලංකාව බ්‍රිතාන්‍ය පාලනය යටතේ පැවතිණි

10 මහාචාර්ය පරණවිතාන මහතා සීගිරි ගී කියවා අර්ථ දැක්වීමෙන් පුළුල් මෙහෙවරක් කළේ යැයි දේශකයා පැවසීය